# ඉදිරි දැක්මකින් යුතු නිවැරදි තීරණ සඳහා ව්‍යාපාරික ආකල්ප උපයෝගී කර ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අත්‍යවශ්‍ය වන මූලික නිල ආර්ථික සංඛ්‍යාති ප්‍රකාශයට පත් කිරීමේ පවතින කාල පමාවට පිළියමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, මේ වන විට ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ව්‍යාපාරවලට සහ විශ්ලේෂකයින්ට දූරදර්ශී ව සහ දත්ත මත පදනම් වූ තීරණවලට එළැඹීමට අවශ්‍ය අවබෝධය ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් බවට පත් ව ඇත. විශේෂයෙන් ම, මූලික සාර්ව ආර්ථික දර්ශකවල වර්තමාන සහ ඉදිරියේ දී අපේක්ෂිත ප්‍රවණතා පිළිබඳ ව ඇති ව්‍යාපාරික අදහස් හා තොරතුරුවලින් යුතු ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, එහි දක්නට ලැබෙන පුළුල් ක්ෂේත්‍ර ආවරණය, ගුණාත්මක තක්සේරු හරහා යටිදැරි ප්‍රවණතා ග්‍රහණය කර ගැනීමට හැකි වන ලෙස ස්ථාපිත කර ඇති ප්‍රමිතිගත ව්‍යුහය, ඉදිරි දැක්මක් සහිත තොරතුරු ලබා ගැනීමට හැකි වීම සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වන ප්‍රයෝජනවත් ස්වාභාවය හේතුවෙන් අනෙකුත් ව්‍යාපාරික සමීක්ෂණවලට සාපේක්ෂ ව මෙම සමීක්ෂණය වඩා වැදගත් ස්වරූපයක් උසුලයි. මෙම සමීක්ෂණ මගින් ප්‍රතිපත්තිවල ඵලදායීතාව පිළිබඳ පෞද්ගලික අංශයේ මතය පෙන්වා දීම, ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍ය හඳුනා ගැනීම සහ සාර්ව ආර්ථික විචල්‍යයන් පුරෝකථනය කිරීම සඳහා අවශ්‍ය ආර්ථික දර්ශක සකස් කිරීම සිදු කරයි. එහෙයින් කැනඩා මහ බැංකුව, ස්වීඩනයේ මහ බැංකුව, යුරෝපානු මහ බැංකුව, ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත පද්ධතිය, ජපාන මහ බැංකුව ඇතුළු මහ බැංකු රැසක්, වෙනස් වන ව්‍යාපාරික වාතාවරණය පිළිබඳ ව ඉදිරි දැක්මකින් යුතු බිම් මට්ටමේ තොරතුරු පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම සඳහා මේ හා සමාන වූ සමීක්ෂණ දියත් කරයි. ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ මගින් දැනට පවතින දත්ත පද්ධති පුළුල් කිරීම, තත් කාලීන ආර්ථික ප්‍රවණතා පුරෝකථනය කිරීමේ හැකියාව දියුණු කිරීම මෙන් ම මධ්‍ය කාලීන සහ දිගු කාලීන පුරෝකථනවල නිරවද්‍යතාව ඉහළ නංවා ගැනීම සිදු කරයි.

### විවිධ මාන ඔස්සේ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික වාතාවරණය නිරීක්ෂණය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව, 2014 වසරේ දෙවන කාර්තුවේ සිට කාර්තුමය වශයෙන් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, මේ වන විට කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ක්ෂේත්‍ර, ඒවායින් ආර්ථිකයට දක්වනු ලබන දායකත්වය නියෝජනය වන ලෙස තෝරාගත් ප්‍රමුඛ ව්‍යාපාරික සමාගම් අතරින්, අවම වශයෙන් ප්‍රමුඛ ව්‍යාපාරික සමාගම් 100ක ප්‍රතිචාර ලබා ගැනීම ඉලක්ක කරයි.

මෙම සමීක්ෂණය මගින් සමස්ත ව්‍යාපාරික තත්ත්වය, ඉල්ලුම, නිෂ්පාදනය, භාණ්ඩ තොග, ධාරිතා උපයෝජ්‍යතාව, ආයෝජන, රැකියා අවස්ථා, ණය, අමුද්‍රව්‍ය සහ නිෂ්පාදිතවල මිල, වේතන, මූල්‍ය තත්ත්වය ඇතුළු ව මූලික ව්‍යාපාරික දර්ශක පිළිබඳ ව පුළුල් අවබෝධයක් ලබා දෙයි. මෙම සමීක්ෂණය මූලික වශයෙන් කෙටි කාලීන ව්‍යාපාරික ක්‍රියාකාරීත්වය පිළිබඳ ව අවධානය යොමු කළ ද, එහි ඉදිරි දැක්ම පුළුල් කිරීමේ අරමුණින්, ඇතැම් දර්ශක හරහා මාස 6ක සහ මාස 12ක අපේක්ෂා පිළිබඳ ව තොරතුරු ලබා ගැනීම ද සිදු කරයි. තව ද, ව්‍යාපාරික මෙහෙයුම්, ආයෝජන, මිලකරණය සහ රැකියා සම්බන්ධයෙන් පවතින ආර්ථික සහ දේශපාලනික අවදානම්වල බලපෑම ඇගැයීම සඳහා සකසන ලද විවෘත ප්‍රශ්නයකින් ද මෙම සමීක්ෂණය සමන්විත වේ.

විමසුම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

### ව්‍යාපාරික මතය පිළිබඳ දර්ශක අර්ථ නිරූපණය කිරීම

මෙම සමීක්ෂණයට ප්‍රතිචාර ලබා දෙන්නන්, පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂ ව යම් විචල්‍යයක වර්ධනය, පහත වැටීම හෝ නොවෙනස් ස්වාභාවය වාර්තා කරනු ලබන ප්‍රතිශත අනුව, ව්‍යාපාරික මතය පිළිබඳ සංජානන දර්ශකයක් සකස් කරනු ලැබේ. 0 සිට 200 දක්වා වූ පරිමාණයකින් මනිනු ලබන සංජානන දර්ශක, 100ට වැඩි දර්ශක අගයක් මගින් අදාල විචල්‍යයේ වර්ධනයක් පෙන්නුම් කරන අතර, 100ට අඩු දර්ශක අගයක් මගින් එහි පහත වැටීමක් හා දර්ශකයේ අගය 100 මට්ටමේ පැවතීම අදාල විචල්‍යය එම අවස්ථාවේ නොවෙනස් ව පවතින බව පිළිබිඹු කරයි. අදාළ දර්ශකය 100ට වැඩි අගයක පැවතීම ව්‍යපාර මතයේ ශක්තිමත් බව පෙන්නුම් කරන අතර, එය 200ට ළඟාවත්ම ව්‍යාපාර මතයේ ශක්තිමත් බව වඩා තීව්‍ර ලෙස පෙන්නුම් කරයි. එමෙන්ම දර්ශකය 100ට අඩු අගයකට පහත වැටෙන විට ව්‍යාපාරයේ පිරිහීම පෙන්නුම් කරන අතර, එය 0 අගය කරා ළඟාවත්ම ව්‍යාපාර මතයේ පිරිහීමේ තීව්‍රතාව ඉහළ යයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ ව්‍යාපාර මතය පිළිබඳ එක් එක් ප්‍රධාන දර්ශකවල ක්‍රියාකාරිත්වය පහත පරිදි විස්තර කළ හැකි ය.

සටහන 1: ව්‍යාපාර තත්ත්වය




ව්‍යාපාර තත්ත්ව දර්ශකය, ව්‍යාපාර මතය පිළිබඳ දර්ශකවල මූලික දර්ශකයක් වන අතර, මෙමගින් වර්තමාන සහ අපේක්ෂිත අනාගත ව්‍යාපාර පරිසරය පිළිබඳ ව සමාගම්වල තක්සේරුව පිලිබිඹු කරයි. වසර අටකට ආසන්න කාලයකට පසු පළමු වතාවට 2024 වසරේ දෙවන කාර්තුවේ දී එම දර්ශකය වර්ධනයක් වාර්තා කළ අතර, එතැන් සිට අඛණ්ඩ ව ඉහළ ගිය දර්ශක අගයන් මගින් පිළිබිඹු කෙරෙන පරිදි ව්‍යාපාර තත්ත්වය පිළිබඳ අපේක්ෂා ව වර්ධනය වීමේ මාවතක ගමන් කරයි. විශේෂයෙන් ම, කොවිඩ්-19 වසංගත කාලය සහ ආර්ථික අර්බුදය වැනි සැලකිය යුතු බාධාකාරී කාල අතරතුර මෙම දර්ශකය එහි අවම මට්ටමට ළඟා විය.

සටහන 2: ව්‍යාපාර කටයුතු




සටහන 3: ධාරිතා උපයෝජ්‍යතාව සහ ආයෝජන




ඉල්ලුම සහ විකිණුම් පරිමාවන් ආර්ථිකයේ ප්‍රවණතා පෙන්නුම් කරන මූලික දර්ශක වන අතර, ධාරිතා උපයෝජ්‍යතාව, ආර්ථික ඵලදායිත්වය සහ අනාගත උද්ධමන තත්ත්ව පිළිබිඹු කරන ප්‍රධාන ව්‍යාපාර දර්ශකයක් වේ. තව ද, ආයෝජන මගින් අනාගත ඉල්ලුම් සහ වර්ධන අපේක්ෂා නිරූපණය කෙරෙයි. මෙම දර්ශකවල හැසිරීම තුළින් අර්බුදය අතුරතුර වූ දැඩි ආර්ථික අවපාතය සහ ඉන් අනතුරු ව ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම පැහැදිලි ව නිරූපණය කරයි.

### තීරණ ගැනීම සඳහා ව්‍යාපාර අපේක්ෂා උපයෝගී කරගැනීම

මෙම සමීක්ෂණය තුළින් අපේක්ෂා කළ පරිදි ම, ප්‍රධාන සංජානන දර්ශක සාර්ව ආර්ථික විචල්‍යයන් සමග සමීප ව හැසිරෙන වන බව එහි ප්‍රතිඵල හරහා පෙන්නුම් කරයි. මීළඟ කාර්තුව සඳහා වන අපේක්ෂාවන් පිළිබිඹු කරන ව්‍යාපාර තත්ත්ව (ඉදිරි දැක්ම) දර්ශකය, එහි පුරෝකථන හැකියාව ඉස්මතු කරමින්, ආර්ථික වර්ධනයට හොඳින් සමපාත වන බව 4 වන සටහන මගින් පෙන්නුම් කරයි. තව ද, කරුණු අර්ථවත් ව අවබෝධ කර ගැනීම සඳහා මෙම විවිධ දර්ශක මගින් එකතු කරගත් තොරතුරු සංගත ආකාරයකින් අර්ථකථනය කිරීම අත්‍යවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, ඉල්ලුම නිෂ්පාදනය අභිබවා ගිය අවස්ථාවක දී, සාමාන්‍යයෙන් නිමි භාණ්ඩ තොග අඩු වීමක් නිරීක්ෂණය කළ හැකි අතර, ධාරිතා උපයෝජ්‍යතාව, ණය සහ ආයෝජන ප්‍රමාණ ද ඉහළ යනු නිරීක්ෂණය

සටහන 4: ව්‍යාපාර තත්ත්ව ඉදිරි දැක්ම සමග දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය




කළ හැකි ය. ඒ අනුව, සමස්තයක් ලෙස, ආර්ථිකය අධික වර්ධන අවධියකට ළඟා වෙමින් පවතින බවත්, මිල පීඩන ඇති කළ හැකි බවත් මෙමගින් පෙන්නුම් කෙරෙයි. මෙම ක්‍රියාකාරීත්වය පිළිබඳව පෙර අවබෝධයකින් සිටීම, පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට සහ අයහපත් බලපෑම් වළක්වා ගැනීමට හෝ අවම කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවස්ථාව ලබා දෙයි. එය වෙනස් වන වෙළෙඳපොළ තත්ත්ව මත පවතින අවදානම් කළමනාකරණය කර ගනිමින් දැනුවත්ව තීරණ ගැනීමට අවශ්‍ය උපායමාර්ග සලසා ගැනීමට සහ වෙළෙඳපොළ අවස්ථා ග්‍රහණය කර ගැනීමට ද ව්‍යාපාරයන්ට අවස්ථාව සලසා දෙයි.

### ආර්ථික තොරතුරු පිළිබඳ සන්නිවේදනය වැඩි දියුණු කිරීම

පසුගිය දශකය පුරා, ශ්‍රී ලංකා මහ බැංකුව එහි පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජනවත් කාලීන හා පහසුවෙන් පරිශීලනය කළ හැකි ආර්ථික දර්ශක සපයමින්, විනිවිදභාවය සහ මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන කටයුතු කිහිපයක් ආරම්භ කර ඇත. ඒ අතරින්, 2015 වසරේ දෙවන කාර්තුවේ සිට අදාල සංජානන දර්ශක නිකුත් කිරීම සහ 2019 වසරේ දෙවන කාර්තුවේ සිට සමීක්ෂණයේ මූලික සාරාංශ ප්‍රකාශයට පත් කිරීම ප්‍රධාන වේ. එයට අමතර ව, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් සමග කලින් කලට සැසි පවත්වා ඒ හරහා සෘජු සම්බන්ධතා පවත්වා ගනිමින්, අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම, ගැටලු නිරාකරණය කර ගැනීම සහ දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලබයි. මෙම ප්‍රයත්න, ශ්‍රී ලංකා මහ බැංකුවේ දර්ශක සම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම, දත්ත මත පදනම් ව තීරණ ගැනීම ප්‍රවර්ධනය සහ ආර්ථික කටයුතු පිළිබඳ ව ලබා දෙන තොරතුරු, පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන්ට අදාළ සහ අනුකූල වන බව තහවුරු කිරීම සඳහා වැදගත් වෙයි.

පාඨකයන්ට ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ දර්ශක සහ සමස්ත සාරාංශ පහත වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

https://www.cbsl.gov.lk/en/statistics/business-surveys/business-outlook-survey.


සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව